# ප්‍රීතිමත් ගමන

**කාන්තා මිත්‍ර සංගමය, කොළඹ 3**

සැප්තැම්බර් සිට දෙසැම්බර් 2024

## කාන්තා මිත්‍ර සංගමය රදගුරුගේ ආවර්ජනය

**ඔබ සියලු දෙනාටම සුභ පැතුම් !**

කාන්තා මිත්‍ර සංගමය ලිපියේ පාඨකයන් සමඟ මගේ අදහස් බෙදා ගැනීමට ලැබීම ගැන සතුටු වන්නෙමි“

ශ්‍රී ලංකා කාන්තා මිත්‍ර සංගමය බොහෝ තරුණ ගැහැණු ළමයින්ගේ ජීවිත සංවර්ධනයට සහය වීමට කැපවී සිටින බැවින්. ඔවුන්ගේ අභියෝගයන්වලට මුහුණදීම සඳහා විශ්වාසය ගොඩ නැඟෙන්නේය.

දෙවියන් වහන්සේගේ හඬට සවන් දුන්නාවූ තරුණ කාන්තාවක් ගැන පුළුල් ලෙස සභාවන්වල කතා කරනු ලබන කාලය මෙයයි. කෙසේ වෙතත් ඇ ගමන් කල මාර්ගය එතරම් පහසු එකක් නොවිය. කන්‍යාවක්ව සිටිය ඇට මූලික පහසුකම් ඇතුව උපත ලබා දීමට සුදුසු ස්ථානයක් නොතිබුනි. විවාහ ගිවිසගත් ස්වාමිපුරුෂයා වූ යෝසෙෆ්ගෙන් මූලික වශයෙන් අවශ්‍ය සහයෝගය ඇයට ලැබුන බවත් සහ ධෛර්‍යයෙන් යුතුව ඇයව හොඳින් රැක බලාගත් බව අපට සටහන් කල හැක.

නවාතැන් ගැනීමට නුසුදුසු වුවද තානායම් හිමියා ඉඩ සපයා දීමෙන් උපකාර කලේය. අපගේ සමාජයේ ඇතිවන විවිධ තත්වයන් නිසා මිනිසුන්ව අවදානම් තත්වයන්වලට ඇද දමනු ලබන්නේය. ඔවුන්ගේ සමහරෙකු ජය ගැනීමේ මාර්ගය සොයා ගන්නවා ඇත. තවත් සමහර අයගේ අධෛර්‍යමත් කම නිසාද අතහැර දමනවාත් ඇත. තවත් සමහරුන්හට අන් අයගේ සහයෝගය ලැබෙන විට මෙම අවදානම් තත්වයෙන් ජය ගැනීමටද හැකි වනු ඇත.

මරිය තුමියගේ කතාවෙන් පෙන්නුම් කරන්නේ ඇය සතුව තිබුන ධෛර්‍යය සහ ඇට අන්අයගෙන් ලැබුන උපකාරය කොයි ආකාරයද යනුවෙන්ය. ඇය අවදානම් තත්වයන්වලට මුණ දුන්නාය. මෙය අපට ඇති ශක්තිය උපයෝගි කර ගැනීමෙන් සහ අපට ලැබෙන සහයෝගය නිවැරදිව භාවිතා කරගතයුතු ආකාරය අපට මතක් කර දෙන්නේය“

ආශිර්වාද නත්තලකට  සුබ පැතුම් !

**ගරු ක්‍රිස්ටෝෆර් බාල්රාජ්**

**රදගුරු කාන්තා මිත්‍ර සංගමය**

# ප්‍රීතිමත් ගමන

## ප්‍රීතිමත් ගමන

## සැප්තැම්බර් සිට දෙසැම්බර් 2024

### ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතින්

- ✓ දිවයිනේ විවිධ ප්‍රදේශයන්වල පවත්වනුලබන කාන්තා මිත්‍ර සංගමයේ ශාඛා රැස්වීම් සහ යාච්ඤා රැස්වීම්.
- ✓ හම්බන්තොට කලාප කාර්යාලයේ පාසැල් ළමුන් සඳහා පවත්වන ක්‍රිස්තු ධර්ම පන්ති.
- ✓ හම්බන්තොට කලාප කාර්යාලයේ පවත්වනුලබන පරිඝණක විද්‍යාගාරය සහ සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානය අගරපතනයේ ආරම්බ කරන ලද නව පරිඝණක විද්‍යාගාරය.
- ✓ මස්කෙලිය සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානයේ පවත්වනුලබන සබත් පාසැල් දිවා ආහාර වේල් ව්‍යාපෘතිය.
- ✓ කාන්තා මිත්‍ර සංගමය මුලස්ථානයේ පවත්වනු ලබන කොළ කැඳ ව්‍යාපෘතිය.
- ✓ කාන්තා මිත්‍ර සංගමය මුලස්ථානයේ කාන්තා මිත්‍ර සංගම් ද කිවන්
- ✓ දික්ඔය කලාප කාර්යාලයේ තේ ව්‍යපෘතිය.

### කැපිපෙනෙන කරුණු

- දකුණු ප්‍රාදේශිකයේ රචනා තරඟය.
- ඔරෙන්ජ් දිනය සහ පියයුරු පිළිකා පිලිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන.
- කාන්තා මිත්‍ර සංගමයේ ශාඛා ස්වර්ගාරෝහන දේවස්ථානය, බණ්ඩාරවෙල නැවත ස්ථාපිත කිරීම.

# කාන්තා මිත්‍ර සංගමය ඉලක්ක 1

## ආත්මික සංවර්ධනය සහ සුභාරංචි ප්‍රකාශ කිරීම

### කාන්තා මිත්‍ර සංගමයේ කාර්ය මණ්ඩලය

උදෑසන බයිබයල් අධ්‍යයනය සහ යාච්ඤාව කොළඹ මුලස්ථානයේ කාර්යමණ්ඩලය සහ ප්‍රාදේශිය කාර්යමණ්ඩලය සමඟ වට්ස්ඇප් ඇමතුම් හරහා කරනු ලබයි.

සෑම සිකුරාදා දිනයන්හි ප.1.30 සිට 2 දක්වා යාච්ඤාවට සභාපතිතුමියද අප සමඟ සහභාගි වන්නීය.



### කලාප කාර්යාලය දික්ඔය

දික්ඔය ප්‍රාදේශිය කාර්ය මණ්ඩලය සෑම සිකුරාදා දිනයන්හි දහවල් 12 සිට ප.ව 2 දක්වා උඩරට ප්‍රදේශයේ කාන්තා මිත්‍ර සංගමයේ සාමිපිකාවන් සහ කාන්තා මිත්‍ර සංගමයේ අභිවෘධිය සඳහා සුබපතන්නන් රෑත් පොත ඉගෙන ගනිමින් යාච්ඤාවට සහභාගි වන්නෝය.




### ලෝක යාච්ඤා දිනයේ සැමරුම

සෑම වසරකම ලෝක යාච්ඤ දිනය පවත්වනු ලබන්නේ සැත්තැම්බර් මස 29 වන දිනයේදිය. කාන්තා මිත්‍ර සංගමයේ ශාඛාවන්හි සමහරක් සාමිපිකාවන් මෙම යාච්ඤාව ඉරිදා දිනයන්හි පැවැත්වූ අතර අනෙකුත් අය විසින් එය වෙන් වශයෙන්, සැප්තැම්බර් මස 29 වන දින සහ ඔක්තොම්බර් මස 29 වන දින පවත්වන ලදි.



### ශාඛාවන්හි මාසික යාච්ඤා රැස්වීම.

ශාන්ත පාවුලු දේවස්ථානය පුණ්ඩලුඔය, සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය අගරපතන, ශාන්ත මරියා දික්ඔය, බොගවන්තලාව, ක්‍රිස්තු දේවස්ථානය බෙවලි සහ ක්‍රිස්තු දේවස්ථානය දික්ඔය, යන දේවස්ථානයන්හි මෙම කාර්තුවට අයත් ඔවුන්ගේ මාසික යාච්ඤාවන් පවත්වන ලදි.



## කාන්තා මිත්‍ර සංගමය ඉලක්ක 2

3 GOOD HEALTH AND WELL-BEING

### එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය ඉලක්ක 3

### නිරෝගිකම සහ යහපැවැත්ම ඉලක්ක 3.5

හානිකර ආකාරයට මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖශධ භාවිතය වැලක් වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම අක්ෂි සායනයේ පසු විපරම, පෙරුමාල් තනලෙට්චුම්ගේ විශ්මජනක තෙරතුරු සමඟ අවසන් වන අතර මෙය ඊලඟ කලාපයට නිකුත් කරන්නට තිබෙන ප්‍රීතිමත් ගමණ සඟරාවේ පළ කරනු ලැබේ.

## ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතීන්



### කොළ කැඳ

මෙම ව්‍යාපෘතිය විසින් කාන්තා මිත්‍ර සංගමයේ ඇතුලත අවට රැකියාවේ යෙදෙන අය වෙනුවෙන් සේවයක් ඉටුවන්නේයු. GFS කිචන් වෙතින් සෞඛ්‍යසම්පන්න සහ සෞඛ්‍යරාක්ෂිතව සාදන ලද කොළ කැඳ වීදුරුවක් ඔවුන් භුක්ති විඳිති. මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය වෙනුවෙන් දෙවියන් වහන්සේට ස්තුති කරන අතර නව වසරේදි වැඩි දියුනු කිරීමට බලාපොරොත්තු වන්නෙමු.

### මස්කෙලිය සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානයේ, පවත්වනුලබන සබත් පාසැල් දිවා ආහාර වේල

පුංචි නමුත් වැදගත් ව්‍යාපෘතියක්. මෙම ව්‍යාපෘතියට උපකාර කිරීම සඳහා කාන්තා මිත්‍ර සංගමයට අවස්ථාවක් ලැබීම ඉමහත් සතුටුකි. දළුවගයෙන් සහභාගි වන දරුවන් 24 දෙනෙකුට පොශ්‍යදායි ආහාර වේලක් සෑම ඉරුදිනයදිම ලබා දෙනු ලැබේ. ළමයින් වෙනුවෙන් මෙම කාන්තාවන් ආහාර පිසීමට ගන්නා උනන්දුව සතුටු විය හැකි කරුනකි.



# කාන්තා මිත්‍ර සංගමය ඉලක්ක 3

4 QUALITY EDUCATION

**එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය ඉලක්ක 4 ගුණාත්මක අධ්‍යාපනය**

**සැමටම ජීවිත කාලය පුරා ගුණාත්මක අධ්‍යාපනයක් ඇතුළුව ඉගෙනීමේ අවස්ථාවක් ප්‍රවර්ධනය කිරීම සහතික කල යුතුය.**

ක්‍රිස්තුධර්මපන්ති හම්බන්තොට කලාප කාර්යාලයේ අඛණ්ඩව පවත්වනු ලබන්නේය.

මෙම පන්තිය මෙහෙයවනු ලබන්නේ කලාප කාර්යාලයේ සම්බන්ධි කාරක නිළධාරිනි, තුෂාරි ප්‍රනාන්දු මහත්මිය විසිනි.



*පරිගණක ඇදහිය නොහැකි තරම් වේගවත්, නිවැරදි සහ මෝඩය. මිනිසුන් ඇදහිය නොහැකි තරම් මන්දගාමී, සාවද්‍ය සහ දීප්තිමත්ය. මේ දෙකම එකට ගත්කල ඔවුන් සිතාගත නොහැකි තරම් බලවත්ය".*
*ඇල්බට් අයින්ස්ටයින් - භෞතික විද්‍යාඥ*

## හම්බන්තොට ප්‍රාදේශිය කාර්යාලයේ පරිගණක විද්‍යාගාරය

ප්‍රාදේශිය කාර්යාලයේ පරිගණක පන්ති අඛණ්ඩව පැවැත්වේ. සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා තුළින් ඔවුන්ව නැවත ඇගයීමක් කරන ලදි. කාන්තාවන් සඳහා වන පන්තියක් 2025 ජනවාරි මස ආරම්භ වීමට නියමිතය.



## ආගරපතන සියලු සාන්තුවරයන්ගේ දේවස්ථානයේ පරිගණක විද්‍යාගාරය

කාන්තා මිත්‍රත්ව සංගමයේ GFS උප භාණ්ඩාගාරික ක්‍රිශාන්ති මැනුවෙල් මහත්මියගේ මැදිහත්වීම තුළින් ජෝන් කීල්ස් ආයතනය හොඳ තත්වයේ ඩෙස්ක්ටොප් පරිගණක 6ක පරිත්‍යාගයක් කරන ලදි. 2024 ඔක්තෝබර් මස 13 වන දින පූජ්‍ය සැම් තුෂාන්තන් සහ කාන්තා මිත්‍රත්ව සංගමයෙ GFS ශාඛාවේ. සභාපතිවරයා විසින් මෙම පාඨමාලාව පිළිබඳව පෝස්ටර්ස් මගින් ප්‍රචාරණය කරන ලද අතර එමගින් අවුරුදු 6-15 අතර වයස් කාණ්ඩයේ දරුවන් 15 දෙනෙකු ආරම්භක පාඨමාලාව හා ලියාපදිංචි වන ලදි. පළමු පන්තිය 2024 ඔක්තෝබර් මස 20 වන දින ආරම්භ කරන ලදි. පාඨමාලාවේ විෂය මාලාව ගුරුතලාව ශාන්ත තෝමස් විද්‍යාලයේ උසස් පෙළ සිසුවෙක් වන ස්ටීව් ජීවරත්නම් විසිනි. ඔහුගේම පරිගණක විද්‍යාගාරය තුළ ඉගැන්වීමට ඔහු ස්වෙච්ඡාවෙන්ම ඉදිරිපත් විය. මෙය බෙහෙවින්ම අගය කළ යුත්තකි. කාන්තා මිත්‍රත්ව සංගමයේ GFS ශාඛාවේ උප සභාපති වන නොයෙලින් තයනාන්තන් මෙම ව්‍යාපෘතිය භාරව කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය සහ කාන්තා මිත්‍රත්ව සංගමයේ GFS කාර්යභාරය උදෙසා පූජ්‍ය සැම් තුෂාන්තන් ලබාදෙන නොමඳ සහයෝගයට අපගේ අවංක ස්තුතිය පුද කරන්නෙමු.





## සාර්ථක කතාවක්

### හම්බන්තොට ප්‍රාදේශිය කාර්යාලය මගින් පවත්වනු ලබන රචනා තරගය

මෙම තරගය හම්බන්තොට ප්‍රාදේශිය කාර්යාලයේ සම්බන්ධීකරණ නිලධාරිණී තුෂාරි ප්‍රනාන්දු විසින් සංවිධානය කරන ලදි. ඇයගේ කාන්තා මිත්‍රත්ව සංගමයේ (GFS) ක්ෂේත්‍ර චාරිකාවලදී නිරීක්ෂණය වූ කරුණක් වූයේ අධ්‍යාපනය කෙරෙහි දරුවන්ගේ උනන්දුව ඉතාමත් දුර්වල බවයි. මෙම රචනා තරගය ගාල්ල සහ බද්දේගම පැවැත්වෙන අතර මෙහි අරමුණු පහත දැක්වේ.

අ). අධ්‍යාපනය සම්බන්ධයෙන් කුඩා වයසේ දරුවන් ධෛර්යමත් කිරීම සහ ඔවුන් තුළ උනන්දුවක් ඇති කිරීම

ආ). පාසල්වල සිය¨ම දරුවන්ට මෙවැනි තරග සඳහා සහභාගි වීමට අවස්ථාවන් නොලැබෙන අතර දක්ෂ දරුවන් සඳහා පමණක් මෙවැනි අවස්ථාවන් ලබාදේ. අප විසින් සියලුම දරුවන් උදෙසා මෙවැනි තරගවලට සහභාගි වීමට හැකිවන පරිදි පොදු අවස්ථාවන් සපයා දෙනු ලැබේ.

ඇ). මෙම දරුවන්ගේ අධ්‍යාපනය විවිධ මට්ටම් වල වන අතර එය දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වේ.

මෙම ව්‍යාපෘතිය මගින් දරුවන්ගේ උනන්දුව වැඩි කිරීම මගින් ලෝක ඉලක්කයේ පරමාර්ථ සපුරාලන අතර එමගින් දීප්තිමත් අනාගතයක් සඳහා අධ්‍යාපන කටයුතුවල වඩාත් ඵලදායී ලෙස නියැලීමට ඔවුන්ව පොළඹවමින් රචනා තරගය නිමා විය. ගාල්ලේ අගරදගුරු සුනිල් ශාන්ත ගුණතිලක විසින් සහතිකපත් අත්සන් කරනු ලැබූ අතර ත්‍යාග ප්‍රදානෝත්සවය හම්බන්තොට ක්‍රිස්තු දේවස්ථානයේදී පැවැත්වුණු අතර අනෙකුත් ශාඛාවන් විසින් දෙසැම්බර් මාසය තුළදී ත්‍යාග ප්‍රදානෝත්සවයන් පවත්වනු ඇත.

රචනා තරගය සඳහා මුළු ගණනින් යුත් ළමුන් 86 දෙනෙක් සහභාගි වූහ. මෙය වසර 1 සිට 12 දක්වා වන වයස් ඛාණ්ඩ හතරකින් සමන්විතය. ජයග්‍රහකයින් වෙුවෙන් රන්, රිදී, සහ ලෝකඩ සහතික පිරිනමණ ලදි. එමෙන්ම ළමුන් 56 දෙනෙකු සඳහා සහභාගිත්ව සහතිතිකද පිරිනමණු ලබයි.





# කාන්තා මිත්‍ර සංගමය ඉලක්ක 4

5 GENDER EQUALITY

## එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය ඉලක්ක 5-
## ස්ත්‍රී පුරුෂ සමානාතමතාවය සාක්ෂාත් කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම

### කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ අපයෝජනය අවසන් කිරීම

එක්සත් ජාතීන්ගේ ඔරේන්ජ් දිනය සෑම මසකම 25 වන දින සමරනු ලබන අතර, එය වාර්ශිකව නොවැම්බර් මස 25 වන දින අවසන් වේ. මෙම වසරේ ප්‍රධාන කාර්යාලයේදි අපි පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් සමඟ ඔරේන්ජ් දිනයද පැවැත්වීමට තිරණය කළේ මෙය ඉතාමත් වැදගත් යැයි පෙනුන බැවිනි. අවාසනාවකට මෙන් හැද හැලුන අධික වරුසාව, ප්‍රජාවේ බොහෝ කාන්තාවන්ගේ පැමිණීම වැළැක් විය. කෙසේ හෝ කාන්තාවන් 29 දෙනෙකු ඇතුළුව කාර්ය මණ්ඩලයද මෙම වැඩසටහනට සහභාගි වුහ. ඉන්දිරා කැන්සර් ට්‍රස්ට් ආයතනය මඟින් පියයුරු පිළිකා පිළිබඳව විශිෂ්ට වැඩසටහනක් පවත්වන ලදි.


කාන්තා මිත්‍ර සංගමය මූලස්ථාන



ඔරේන්ජ් දිනය සහ පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීම


සියලු ශාන්තුවරයන්ගේ සභාව, අගරපතන

මෙම කාර්තුවේ කාන්තා මිත්‍ර සංගම් ශාඛා සියලු ශාන්තුවරයන්ගේ දේවස්ථානය අගරපතන, ශ්‍රී ලංකා පොලිසිය හා එක්ව ඔරේන්ජ් දිනය වෙනුවෙන් වැඩසටහනක් පවත්වන ලදි.

# කාන්තා මිත්‍ර සංගම් ශාඛා බැහැදැකීම සහ ක්‍රියාකාරකම්

## කාන්තා මිත්‍ර සංගමයේ සංවර්ධනය

කාන්තා මිත්‍ර සංගමයේ සංවර්ධනය යන සංකල්පය යටතේ ස්වර්ගස්ථ දේවස්ථානය බන්ඩාරවෙල ගරු ජෝයෙල් ජැක්සන් පියතුමා සහ ඔහුගේ භාර්යාව වන මෙඩෝ මහත්මියගේ උපකාරය ඇතුව නොවැම්බර් මස 24 වන දින නැවත ක්‍රියාත්මක කරන ලදි. දේවිනි තිසාරච්චි විධායක නිළධාරිණී සහ මර්සි අරුලානන්දම් ඌව ප්‍රදේශයේ සම්බන්දිකාරක නිළධාරිණී දේවස්ථානය පැහැදැක ශාඛාව නැවත ස්ථාපිත කරන ලදි. උද්යෝගිමත් නව කමිටුව ක්‍රියාකාරකම් කිපයක් කිරීමට බලාපොරොත්තු වෙන් සිටි!

ඒ අයගේ අනාගත ක්‍රියාකාරකම් වෙනුවෙන් අපගේ සුබ පැතුම්!




## ශුද්ධ ලූක්ගේ දේවස්ථානය

පූජ්‍ය ජෝසප් ජොන්සන් දෙනියාය දේවස්ථාන දෙක භාරගත් පසු තුෂාරි මහත්මියගේ පළමු සංචාරට මෙය විය. ඇය ඔක්තෝබර් 6 වන දින ඔවුන් හමුවීමට ගිය අතර කාන්තා මිත්‍රත්ව සංගමයේ(GFS) ශාඛාවේ සාමාජිකයින් සමග ඉතාමත් ඵලදායි කාලයක් ගත කිරීමට ඇයට හැකියාව ලැබිණි.

සමහර කමිටු සාමාජිකයින් රැකියා සඳහා ප්‍රදේශයෙන් පිටව ගොස් ඇත. නව සාමාජිකයින් තේරී පත්විය. මෙම හමුවේදී කාන්තා මිත්‍රත්ව සංගමයේ (GFS) විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳව තවදුරටත් දැනුවත් වීමට පූජක ජොන්සන් තුමාට අවස්ථාව ලැබුණි. (GFS) සේවය අඛණ්ඩව පවත්වාගෙන යන බවට එතුමා පොරොන්දු විය. මෙය අපව ඉමහත් සේ ධෛර්යමත් කරන කාරණාවක් වන අතර එය සතුටින් යුතුව සටහන් කරන්නෙමු.




## බෙවර්ලි ක්‍රිස්තු දේවස්ථානය

තුෂාරි විසින් මෙම රැස්වීමට සහභාගි වූ සහෝදර ජස්ටින් සමග GFS සාමාජිකයින් සඳහා සුහද සාකච්ඡාවක් පවත්වන ලදි. බෙවර්ලි යනු ඉතාමත් දුෂ්කර ප්‍රදේශයක් බවත් පිටස්තර පුද්ගලයින් බොහෝවිට එහි නොපැමිණෙන බවත් කාන්තාවන් පැවසීය. එයට හේතු වී ඇත්තේ ප්‍රවාහන දුෂ්කරතා සහ දුරස්ථභාවයයි. මෙවැනි තත්වයක් තිබියදිත් GFS ඔවුන් වෙත පැමිණීම පිළිබඳව ඔවුන් තම කෘතඥතාවය පළ කළේය. මෙම රැස්වීමට සියලුම GFS සාමාජිකයින් පැමිණ තිබූ අතර ඒ පිළිබඳව සඳහන් කිරීම වැදගත් යැයි සිතමි.




## මාර්ක් දේවස්ථානය, බදුල්ල

ප්‍රධාන විධායක නිළධාරි දේවිනි තිසරාරච්චි සහ ඌව පළාත භාර සම්බන්ධීකරණ නිළධාරිණී මර්සි අරුලානන්දම් හට ශාඛාව බැලීමට යාමටත් දහවල් 1.00 සිට සවස 3.45 දක්වා ගැහැණු ළමයින් සහ කාන්තාවන් උදෙසා රැස්වීමක් පැවැත්වීමටත් හැකියාව ලැබුණි. සභාපති ලෙස පත්ව සිටි පුද්ගලයාට බදුල්ලෙන් පිට රැකියාවක් ලැබී ඇති බැවින් ඔහුට තව දුරටත් එම වගකීම දැරීමට නොහැක. මෙහිදී ලබාදුන් පණිවුඩය වූයේ GFS හි වැඩ සම්බන්ධ කරමින් "ක්‍රියාකාරි මිතුරන්" යන්නයි.



## දික්ඹය ක්‍රිස්තු දේවස්ථානයේ මව්වරුන්ගේ සංගමය සමග හමුව

ඩැනියෙල් පියතුමා විසින් GFS සාමාජිකයින් කිහිප දෙනෙකු ඇතුලත් මව්වරුන්ගේ සංගමයේදී ලෝක යාච්ඥා දිනය පිළිබඳව කතා කිරීම සඳහා අපගේ ප්‍රාදේශීය සම්බන්ධීකාරක ජෙමීමා මෝසෙස් මහත්මියට ආරාධනා කරන ලදි. GFS සහ මව්වරුන්ගේ සංගමය යන දෙකම අත්වැල් බැඳ ගනිමින් දික්ඹය ක්‍රයිස්ට් දේවස්ථානයේ බොහෝ වැඩ කටයුතු කරන බැවින් එය ඉමහත් සතුටට කාරණයකි.



## බදුල්ල ශාන්ත මාර්ක් දේවස්ථානයේ ළමා හා වැඩිහිටි දින වැඩසටහන

මෙම කුඩා වැඩසටහන හරහා දෙමාපියන් කළ යුතු දේ, නොකළ යුතු දේ සහ දරුවන්ගේ අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කිරීමට උත්සාහ කරන ලදි. වයෝවෘද්ධ දෙමාපියන්ට බරක් නොවී ස්වාධීනව වගකීම් ඉටු කරගනිමින් ඔවුන්ව ආදරයෙන් රැකබලා ගනිමින් විශ්‍රාමික කාලය සතුටින් ගත කිරීමට ඉඩ සලසා දෙන මෙන් වැඩිහිටියන් සම්බන්ධ පණිවුඩයෙන් ඉදිරිපත් කරන ලදි, **අපේ ලෝකය අපට දෙන්න** මැයෙන් ළමා නාට්‍යයක් ඉදිරිපත් කරන ලදි. "අපට (ළමයින්ට සහ වැඩිහිටියන්ට) අවශ්‍ය නිදහස ලබා දෙන්න" යන පණිවුඩය මෙම නාට්‍යය හරයා ඉදිරිපත් කරන ලදි. පූජ්‍ය මංජුල විසින් නාට්‍යයෙන් ඉදිරිපත් කළ පණිවුඩය සම්බන්ධ කරගෙන නැවත එම පණිවුඩය අවධාරණය කරන ලදි. ඉන්පසු ළමයින්ට සහ වැඩිහිටියන්ට කුඩා තෑගි ලබාදීම සහ සංග්‍රහයක් සිදුකරන ලදි. ළමයින්ට සහ වැඩිහිටියන්ට ගෞරව කිරීම සඳහා දේවස්ථානය විසින් පවත්වන ලද මෙම වැඩසටහනට දායක වීමට ලැබීම පිළිබඳව GFS ඉතාමත් සතුටු වන්නෙමු.



## කාන්තා මිත්‍ර සංගම් ශාලාවේ නත්තල් අලෙවිය

මෙම වාර්ශික අලවිය කාන්තා මිත්‍ර සංගම් ශාලාවේ නොවැම්බර් මස 29 වන දින සිකුරාදා පැවැත්වුනි. මෙය 38 දෙනෙකුට වඩා අධික විකුණුම්කරුවන්ගෙන් යුත් සාර්ථක අලවියක් වුනි.





# නත්තල විනෝදජනක කරුණක්

**බලාපෙරොත්තුවේ සහ නව ප්‍රබෝධයක සංකේතය:** මූලික වශයෙන්ම නත්තල් ඉටිපන්දම බලාපොරොත්තුවේ ආලෝකය ලෙසින් සංකේතවත් කරයි. විශේෂයෙන්ම ශීත කාලයේ අඳුරුම දිනවලදී දැක්විය හැකි සංවේදි සංකේතයක් ලෙසින්, එහි උණුසුම්, දිදුලන ප්‍රභාමය කෙතරම් අඳුරු අවස්ථාවක වුවද, අපට මග පෙන්වන ආලෝකයක් ඇතැයි අපට සිහි කරවයි. අපි "ලෝකයේ ආලෝකය" ලෙස හැඳින්වෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත සමරනවිට, ඉටිපන්දමට වඩාත් වැදගත් අරුතක් හිමි වේ. එය විශ්වාසය නැවත ප්‍රබෝධ කරවීමේ සහ දිදුලන අනාගතයක් සඳහා වූ පොරොන්දුවේ සංකේතයක් ලෙස පෙන්නුම් කරයි.

**එක්සත්කම සහ සම්බන්ධතාවයේ චාරිත්‍රය:** ඉතිහාසය පුරා, ඉටිපන්දම මිනිසුන් එකට රැස් කිරීමට, එක්සත්බව සහ සම්බන්ධතාවය වර්ධනය කිරීමට මූලික කාර්යභාරයක් භාරගෙන ඇත. නත්තල් සමයේ, පවුල් සහ සමාජයන්, ඉටිපන්දම ආලෝකයේ මෘදු දිදුලන ආලෝකය වටා එකතු වෙති. කථා බෙදා ගනිමින්, කැරොල් ගීත ගියනා කරමින් සහ කෘතඥතා යාච්ඤා ඉදිරිපත් කරයි. එය බෙදාගත් අවස්ථාවේ, ඉටිපන්දම ආලෝකයට වඩා වැඩි දෙයක් බවට පත් වන අතර, අපව එක් කරන සම්බන්ධතා සංකේතයක් බවට පත් වෙයි.

**ප්‍රායෝගිකව හමුවීමේ සංකේතය:** එහි සංකේතාත්මක වැදගත්කමෙන් ඔබ්බට නත්තල් ඉටිපන්දම ප්‍රායෝගික අරමුණක් සඳහාද සේවය කරයි. දිගු ශීත රාත්‍රීන් සඳහා ආලෝකය ලබා දෙමින් සහ නිවාඩු දින සැමරුම්වල උත්සව වාතාවරණයක් එක් කරයි. කෑම මේසය මත කේන්ද්‍රස්ථානයක හෝ අමුත්තන් පිළිගැනීමට කවුළුවක සකසනු ලැබුවද, ඉටිපන්දමෙහි මෘදු දැල්වීම ඕනෑම රැස්වීමකට උණුසුම සහ සම්පත්වය එක් කරයි.

**ප්‍රීතිය සහ කරුණාව පතුරුවා හැරීම:** බොහෝවිට බෙදීම් සහ අසමගියෙන් පිරුණු ලෝකයක, නත්තල් ඉටිපන්දම අපට අපගේ හවුල් මනුෂ්‍යත්වය සහ අපි යන ඕනෑම තැනක ප්‍රීතිය සහ කරුණාව පැතිරවීමේ වැදගත්කම මතක් කරදෙයි. පුණ්‍ය ක්‍රියාවන්, දයාබරත්වය හෝ අවශ්‍යතා ඇති අයට සවන් දීමෙන්, සෑම දැල්වෙන දැල්ලක්ම බලාපොරොත්තුව සහ හොඳ හිතේ ආලෝකයක් ලෙස සේවය කරයි. වඩාත් දයානුකම්පිත සහ සිය¨ දෙනාම ඇතුලත් සමාජයක් සෑදීමට මග පෙන්වයි.

**ඇතුලාන්ත ආලෝකය වැලඳ ගැනීම:** අපි නිවාඩු සමය සහ එහි සිය¨ සම්ප්‍රදායන් වැලඳ ගන්නාවිට නත්තල් ඉටිපන්දම පිටුපස ඇති ගැඹුරු අර්ථය අමතක නොකරමු. එහි දැල්වෙන දිදුලන තරු තුළ බලාපොරොත්තුව, එකමුතුකම සහ දයානුකම්පාවේ සංකේතයක් අපට හමුවේ- අප සෑම කෙනෙකු තුළම පවතින ආලෝකය සහ අප අවට සිටින අයට උණුසුම හා ප්‍රීතිය පතුරුවන්න ඇති බලය අපට සිහිපත් කරයි. එබැවින් මෙම නත්තලේදි ඔබේ ඉටිපන්දම් දල්වන විට, ඒවායේ දිප්තිය බලාපොරොත්තුවේ ආලෝකයක් ලෙසත්, සාමයේ සැබෑ ආත්මය සිහිගන්වන්නක් ලෙසත් ක්‍රියා කරයි.

**උපුටා ගනු ලැබුවේ ක්‍රිස්මස් එන්තුස්සියැස්ටික් තුලින්ය**



# නත්තල් සුභ පැතුම

අපි යේසුස් වහන්සේගේ උපත සමරන අතර නව වසර දෙස බලා සිටින ඔබේ හදවත් බලාපොරොත්තුවෙන්, සාමයෙන් හා සතුටින් පිරේවා! අප සැමගෙන් ඔබ සැමට සුබනත්තලක් සහ සමෘද්ධිමත් නව වසරක්!!



විධායක සභා සාමාජිකයින්



කාන්තා මිත්‍ර සංගමය



සියලු ශාන්තුවරයන්ගේ සභාව, අගරපතන



සියලු ශාන්තුවරයන්ගේ සභාව, මස්කෙලිය



ක්‍රිස්තු දේවස්ථානය, බෙවර්ලි

# නත්තල් සුභ පැතුම්



ක්‍රිස්තු දේවස්ථානය, දික්ඔය



ක්‍රිස්තු දේවස්ථානය, බද්දේගම



ක්‍රිස්තු දේවස්ථානය, හම්බන්තොට



ක්‍රිස්තු දේවස්ථානය, මාතලේ


ස්වර්ගස්ථ දේවස්ථානය, බණ්ඩාරවෙල



අන්වෙසත්විමේ සභාව, බොනවිස්ටා

# නත්තල් සුභ පැතුම්



ශාන්ත ඇන්ඩෲ දේවස්ථානය,
මඩකලපුව



ශාන්ත ලූක්තුමාගේ
දේවස්ථානය, දෙනියාය



ශාන්ත මාර්ක්තුමාගේ
දේවස්ථානය, බදුල්ල



ශාන්ත මරියතුමියගේ දේවස්ථානය,
නාවටිකුඩා




ශාන්ත මරියතුමියගේ දේවස්ථානය,
බොගවන්තලාව




ශාන්ත පාවුලුතුමාගේ දේවස්ථානය,
පුණ්ඩලුඔය



ශාන්ත පාවුලුතුමාගේ දේවස්ථානය,
මයිලාම්බවෙලි



මූලස්ථාන කණ්ඩායම




58, ආනන්ද කුමාරස්වාමි මාවත කොළඹ 3.

+94 11 2 573214-5 / 011 2 573223

gfsofsrilanka@gmail.com

FB – Girls' Friendly Society, Sri Lanka
GFS Hall, Colombo 03
GFS Sri Lanka : Women helping Women